සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ

සහ

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ

ගෞරවාන්විත ඇරයුමෙන්

කොළඹ නව කෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝනායක,

සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටකාචාර්ය

**පූජ්‍ය දිවියාගහ යසස්සි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

මූලාසනය හොබවන

බුද්ධශාසන ගරු අමාත්‍ය

**ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගේ**

ප්‍රධානත්වයෙන්

නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය

**සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ**

සම්භාවනීය සහභාගිත්වයෙන්

ශ්‍රී බුද්ධ වර්ෂ 2563 ක් වූ බිනර මස 19 වන දින හෙවත්

ව්‍යවහාර වර්ෂයෙන්

සැප්තැම්බර් මස 19 වන දින සවස 2.30ට

ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රයේ ලෝටස් ශාලාවේදී

පැවැත්වෙන

**බෞද්ධ සාහිත්‍ය උත්සවය**

නිමිත්තෙන්

මෙම සමරු ග්‍රන්ථය නිකුත් කරන වගයි.

බෞද්ධ සාහිත්‍ය උත්සවය
මුද්‍රණය 2019

**සංස්කරණ උපදේශකත්වය**
ආචාර්ය කලාසූරි ප්‍රණීත් අභයසුන්දර

**සංස්කරණ කළමනාකරණය**
පුෂ්පදේව පතිරගේ

**සංස්කරණය**
ආනන්ද බෝධිනායක


**සම්බන්ධීකරණය**
දිලුම් වාහලතන්ත
චමිල පතිරණ

**පරිගණක සැලසුම්කරණය**
පුබුදු කිරිබත්ගොඩ

මුද්‍රණය
[illegible] (පුද්) සමාගම
93 [illegible], කොළඹ 10.
[illegible] 6823

[illegible]

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380 බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන : +94 112 688 517 / +94 112 691 695
ඊමේල් : acbc@acbc.lk / acbc380@gmail.com
www.acbc.lk



# සාහිත්‍යය; සංස්කෘතික සමාජානුයෝජනය



**ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල**
සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

සාහිත්‍යය සමාජානුයෝජනය වීම වනාහි යම් කිසි ජාතියක් සංස්කෘතිගත වීමේ පටන් ගලා එන ක්‍රියාවලියේ එක් පාර්ශ්වයකි. සමාජය කම්පනය කළ සිදුවීම් විවිධ මුහුණුවරින් යුතු ව කාල දේශ සමතික්‍රමණය කොට මානව සංස්කෘතියෙහි ශේෂ වෙයි. එය සාහිත්‍යයෙහි ශේෂ වූ කල්හි අපි ඒවා විශ්ව සාහිත්‍ය ප්‍රවණතා ලෙස හඳුන්වමු. බොහෝ විශ්වීය ප්‍රවණතාවල දැකිය හැක්කේ මෙසේ ශේෂ වූ කම්පනවල ප්‍රතිඵල ය.

සාහිත්‍යය සමාජානුබද්ධව මනුෂ්‍යයා පාදක කොට ගෙන ම ක්‍රියාත්මක වී ඇති ප්‍රපංචයකි. එමෙන් ම සාහිත්‍යය එය පහළ වන කවර හෝ සමාජයක සමකාලීන සමාජ අගනාකම් සියුම් හැඟීම්, බැඳීම් නිරූපණය කරන ප්‍රබල සන්නිවේදන මාර්ගයක් ද වෙයි.

ඇතැම් සාහිත්‍යාංග ශත වර්ෂ ගණනාවක් ගතවීමෙන් පසුවත් එහි මූලික ස්වරූපයෙහි පවත්නා ආවේණික තත්ත්වය රැකගනිමින් සංස්කෘතියට සමාජානුයෝජනය වෙයි. මෙය සිදුවන්නේ ඒවායෙහි ඇති අකාලික ගුණ කරණ කොට ගෙන ය.

සාහිත්‍යයෙන් මනුෂ්‍ය ගුණධර්ම, අගනාකම් සමාජය වෙත මුදාහැරීමේ කාර්යය නිරායාසයෙන් සිදුවෙයි. ඇතැම් සිදුවීම් සාහිත්‍යයට එක් වන විලාසය මෙන් ම ඒවා සමාජය වෙත මුදාහැරීමේ දී එම සිදුවීම් සමාජගත වී ඇති ආකාරයෙහි ස්වරූපය ද විමසිය යුතු ය. ඒ අනුව සමාජය, මිනිසා සහ සාහිත්‍යය අතර ඇති දෘඪ බැඳීම පැහැදිලි කරගත හැකි වෙයි.

සාහිත්‍යය සමාජය වෙත අත්‍යන්තයෙන් බැඳී පවතිනවා මෙන් ම එහි සංස්කෘතික බැඳීම ද ප්‍රබල ය. සමාජය වෙත ආගමික වශයෙන් ප්‍රතිබද්ධ සිදුවීම් සංස්කෘතිය හා බැඳී පවතින ප්‍රබලතාව අනුව එහි කාර්යභාරය මෙන්ම සාහිත්‍ය හා සංස්කෘතියේ ආයුෂ ප්‍රමාණය ද තීරණය වෙයි. සාහිත්‍යයෙහි සංස්කෘතික කාර්යභාරය ප්‍රබල වන පමණට එහි පැවැත්ම විශ්වව්‍යාපී වෙයි.

ලාංකේය ත්‍රිපිටක සාහිත්‍යය, සම්භාව්‍ය සාහිත්‍යය, බෞද්ධ සංස්කෘත සාහිත්‍යය, ඇතැම් භාරතීය සාහිත්‍ය කෘති, භාරතය ඇතුළු ව ආසියානු කලාපය පුරා පැතිරී ඇති විවිධ කලා කෘති සම්භාරය බුදුන් වහන්සේගේ චරිතය පිළිබඳ ව සිදුවීම් සාහිත්‍ය සමාජානුයෝජන ක්‍රියාවලියේ දී සංස්කෘතියට කෙතරම් දායක වී ඇත්දැයි පෙන්නුම් කරයි. සමස්ත කලාව මේ මනුෂ්‍යයා වටා කෙතරම් දුරට විකාසනය වී ඇත්දැයි මෙයින් පැහැදිලි වෙයි.

සිද්ධාර්ථ ගෞතමයෝ විශිෂ්ට සමාජ සත්ත්වයෙක් ව සිටියහ. මේ අපූරු සමාජානුබද්ධ මනුෂ්‍යයාගේ ජීවන සිදුවීම් සාහිත්‍යය, සමස්ත කලාව කෙතරම් සෞන්දර්යයෙන් පුරවාලුයේ ද? කෙතරම් ප්‍රමාණයක් නිර්මාණකරුවන්ගේ නිර්මාණවලට උල්පත වූයේ ද? ඒ නිර්මාණ මේ සියල්ල ඉක්මවා ඒවායෙහි ඇතැම් අංග සංස්කෘතික අංගෝපාංග දක්වා විවිධ සමාජ ස්තර අතරට එක් වී ඇත් දැයි විමසිය යුතු ය.

මෙම ලිපියෙන් උත්සාහ දරනුයේ සිද්ධාර්ථ ගෞතමයන් හා සම්බන්ධ එක් ජීවන ප්‍රවෘත්තියක් සාහිත්‍යය සමතික්‍රමණය කොට සංස්කෘතික වශයෙන් මුල් බැස ගෙන ඇති අයුරු සරල ව විග්‍රහ කිරීමට ය.

බුද්ධ චරිතය හා සම්බන්ධ ප්‍රකට සිදුවීමක් වූ

අංගුලිමාල ප්‍රවෘත්තිය ක්‍රිස්තු පූර්ව සයවන සියවසේ සිට වර්තමානය තෙක් වන මේ සා දිගු ගමනක් ආයේ කෙසේ ද? එයින් අප වර්තමානයේ භුක්ති විඳින සංස්කෘතිකමය ඵලය කවරේ ද?

අපදාන සාහිත්‍යය, සූත්‍රාන්ත පිටකයෙහි මජ්ඣිම නිකාය, ධම්මපදට්ඨකථාව, ධම්පියාඅටුවාගැටපදය, අමාවතුර, බුත්සරණ වැනි සම්භාව්‍ය කෘතිවල මේ ප්‍රවෘත්තිය සනිටුහන් වන්නට පෙර පරම්පරා සිය ගණනක් එය ජාතකභාණක භික්ෂූන් වහන්සේලාගේ අප්‍රතිහත ධෛර්යයෙන් යුක්ත වූ මුඛපරම්පරානුගත ව සමාජය මතුයෙහි පවතින්නට ඇත.

සිද්ධාර්ථ ගෞතම චරිතයෙහි විශිෂ්ට අවස්ථාවක් පෙන්වා දෙනු සඳහා අංගුලිමාල ප්‍රවෘත්තිය බෞද්ධ සාහිත්‍යයට එක් ව තිබේ. විශේෂයෙන් විෂම පුරුෂයන් දමනය කිරීමේ අවස්ථාව නිදසුන් කොට දක්වනු සඳහා අංගුලිමාල ප්‍රවෘත්තිය යොදා ගෙන ඇත. සාහිත්‍යයේ එන අවස්ථා කීපයක් මෙසේ විමර්ශනයට ලක්කොට එය සංස්කෘතියෙහි නිදන්ගත වී ඇති ආකාරය අනතුරුව විමර්ශනය කරමු.

අමාවතුර, බුත්සරණ ආදි සිංහල සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවලට පාදක වන්නේ සෘජුව ම සූත්‍රාන්ත පිටකයෙහි මජ්ඣිම නිකායේ මජ්ඣිම පණ්ණාසකයෙහි එන අංගුලිමාල සූත්‍රය යි. එහි අංගුලිමාල වෘත්තාන්තය ආරම්භ කරනුයේ එක්වර ම අංගුලිමාලගේ රුදුරු ස්වරූපයෙනි.

> රඤ්ඤො පසේනදිස්ස කොසලස්ස
> විජිතෙ චොරො අංගුලිමාලො
> නාම හොති ලුද්දො ලොහිතපාණි
> හතපහතෙ නිවිට්ඨො
> අදයාපන්නො පාණභූතෙසු.
> තෙන ගාමාපි අගාමා කතා,
> නිගමාපි අනිගමා කතා, ජනපදාපි
> අජනපදා කතා. සො මනුස්සෙ
> වධිත්වා වධිත්වා අංගුලිනං
> මාලා ධාරෙති..(මජ්ඣිම නිකාය,
> ද්විතීයභාගය: 516).

> (පසේනදී කොසොල් රජහුගේ
> විජිතයෙහි අඟුල්මල් නම්
> සොරෙක් ඇත. හේ දරුණුය. ලේ
> වැකුණු අත් ඇතියේ ය. මෙරමා
> පැහැරීම් හා මැරීම්හි බැස සිටියේ
> ය. සතුන් කෙරෙහි කරුණා
> නැත්තේ ය. උහු විසින් ගමුදු
> නො ගම් කරන ලද. නියම්ගමුදු
> නො නියම්ගම් කරන ලද. දනවුදු
> නොදනවු කරන ලදී. හේ මිනිසුන්
> මරමරා අඟුල්මල් ධරයි (මජ්ඣිම
> නිකාය, ද්විතීයභාගය: 517).

අමාවතුරෙහි අංගුලිමාල කථාව ඇරඹෙන්නේ

අඟුල්මල් සොරහු දැමූ පරිදි කියේ ද යත්, කොසොල් රජුගේ භාර්ගව නම් පුරෝහිතයා පිණිස මන්තාණි නම් බැමිණි ගැබ්ගෙන රෑ පුතකු පසව කළා. උහු මව් කුසින් නික්මෙණ කල සියලු නුවර ආයුධ දිලිහින (අමාවතුර 1887: 25) ආදි වශයෙනි.

අමාවතුරෙහි එන මේ අවස්ථාව පිළිබඳ විමර්ශනය කරන විට පෙනී යන කරුණක් නම් සාහිත්‍යයෙහි කාර්යභාරය අමාවතුර රචනා වන කාලය වන විට වෙනස් මුහුණුවරක් ගන්නා අන්දමයි. ගුරුළුගෝමීන් සිය පැන මෙහෙය වන්නේ සමාජ සංසිද්ධීන් ද පාදක කොට ගෙන ය.

> සාහිත්‍යයෙහි කාර්යභාරය පිළිබඳ
> මූලික අදහස් දෙකක් ප්‍රචලිත
> ව පවතී. ඉන් පළමුවැන්න
> වන්නේ මිනිසා විසින් තම
> දෛනික ජීවිතයේ දී විඳිනු ලබන
> දුක්ඛදෝමනස්සයන් අමතක
> කොට ඔහු එහා තලයකට
> රැගෙන යාම ය. මෙම දෘෂ්ටිය
> සැලකෙන්නේ සාහිත්‍යයේ
> විඥානවාදය හැටියට ය. එයට
> අනුව සාහිත්‍යයෙහි කාර්යභාරය
> විය යුත්තේ ජනතාව ප්‍රබෝධ
> කොට ඔවුන්ගේ අදහස් පෝෂණය
> කිරීම ය (පල්ලියගුරු 2002: 22,23).

අමාවතුර ලියැවෙන සමය වූ කලී හින්දු භක්තිවාදය ප්‍රචලිත ව දේව සංකල්ප රටපුරා ව්‍යාප්ත වන සමය යි. අමාවතුර කතුවරයා එම භක්තිවාදය ම මුල් කොට ගෙන බුදුන් වහන්සේ පිළිබඳ ව පාඨකයාගේ ශ්‍රද්ධා භක්තිය දියුණු වන ආකාරයට සිය කතා ප්‍රවෘත්තිය ඉදිරිපත් කරන බව පැහැදිලි ය. මෙහි දී අංගුලිමාල භයානක වන තරමට ම, රුදුරු වන තරමට ම බුදුන් වහන්සේ පිළිබඳ භක්තිය ක්‍රමයෙන් වැඩි වන ආකාරයටත් කතා රසය අතිසියුම් ආකාරයෙන් වර්ධනය වන ආකාරයටත් අමාවතුරෙහි බස සකස් වී තිබේ.

අංගුලිමාල වන්නේ කවරෙක් ද? අහිංසක ය. ඔහුට අහිංසක යැයි නම් තබන්නේ ඇයි?""උහු නම්

... නිසා ... දිලිසෙන ආයුධයෝ ... නොකළ හෙයින් අහිංසක යැයි ... යනාදි වශයෙන් අමාවතුරකරුවා විස්තර ... ම "උඹ විය පත් කල්හි මවුපියෝ සිල්ප ... තක්සලා නුවර යවුහු. හේ ධර්මාන්තේවාසික ... වත්සපන. කී කී දැයක් වන වනා ... වන නියායෙන් හැසිරෙයි. පෙම් ... නියායෙන් මෙණෙයි. සෙසු දරුවෝ පිටත් ... අහිංසක මානවකයා ආ තැන් පටන් ගෙන ... නොපෙණෙන්නම්හ යි" උහු කිසේ බිඳුවම්හ ... ගන්නාහු (අමාවතුර 1887: 26)" මේ අවස්ථාව ... වශයෙන් විස්තර කරයි. එපමණක් නොවේ, ... පත්නිය සමග අනියම් සබඳතාවක වගවිත්ති ... කෙසේ හෝ අහිංසක සිය ගුරුවරයාගෙ ... තක්සලා සගයන්ට හැකි වෙයි. අනතුරු ... බිඳවීමට ... ඇදුරු සිල්ප සම්පාදනයට උපචාර ... මිනිසුන් දහසක් මරන්න යැ යි සිය සිසුවා ... අහිංසකගේ පිළිතුර වනුයේ "අප අන්නට ... නොකරණ කුලෙහි උපන්නම්හ. එසේ නොකට ... " (අමාවතුර 1887: 26) යනුවෙනි. එහෙත් අහිංසක ... අතට ගන්නේ ශිල්පයට උපහාර පිණිස සහ ... එල ලබනු පිණිසය. අහිංසක සිය ගුරුවරයා ... අනතුරුව අංගුලිමාල වී බුදුන් වහන්සේ ඔහු ... එළඹෙන අවස්ථාව තෙක් අමාවතුරකරුවා ... ලෙස සිය කතා රසයෙන් ප්‍රයෝජන ගනියි. මේ ... අවස්ථාවකි. විමසන්න.

පියබමුණු මපින් වන්නේ ය යි
සිතා මවු බැමිණියට අඟුල්මල් නම්
සොරෙක් උපන. හේ අනෙකෙක්
නොවෙයි හි පුත් අහිංසක කුමරය
දැන් රජු උහු ගන්නට යෙයි කුමක්
කටයුත්තේදැ යි කීය. යා හිමි ම
පුතු ගෙණ එව යි කීව. සොඳුර
මම් යන්නට නොනිස්සෙමි. මව්
වනාහි ලය මෙලෙක් වෙයි. එයින්
හෝ මම් ම පුතු ගෙන එමියි
නික්මිණ.

ඒ දවස් බුදුහු දෙව්රම් වෙසෙමින්
අලුයම්සමාහි ලෝ බලන්නනු
අඟුල්මම් සොරහු දැක මා ගිය
කල උහුට සෙත් වෙවයි. ගම් නැති
තැන මහවල්හි සිටියේ සිවු බඳ
ගයක් අසා මා කෙරෙහි පැවදි ව
රාත් වෙයි. ඉදින් නොගියෙමි නම්

... මෑ ... සතයින් නොතැබිය හැකි
වෙයි. උඹට සංඝුන කළ මැනවු
යි.. (අමාවතුර 1887: 27)

අනතුරු ව බුදුන් වහන්සේ අංගුලිමාල දමනය කර ගන්නා ආකාරයත් සිය මව මැරීමේ චිත්තනයෙන් ඔහු ගලවා ගන්නා ආකාරයත් අනුපම කතා රසය මතු කරන ආකාරයෙන් විස්තර කරයි.

අහිංසක අංගුලිමාල බවට පත් වන්නේ සිය ගුරුවරයාගේ පෞද්ගලික අරමුණක් ඉටු කර ගැනීමට යාම නිසා ය. එහෙත් බුදුන් වහන්සේ හමුවී ගුරුවරයා මුණගැසීමේ අවස්ථාවේ සිට අංගුලිමාල සිය ජීවිතය යනු කුමක් දැයි අත්විඳියි. මේ අවස්ථාව ආචාර්ය ජී.ඩබ්ලිව්.අදිකාරම් මෙසේ විමර්ශනය කරයි.

කෙනෙකු කරන නරක ක්‍රියා
හෝ හොඳ ක්‍රියා හෝ හට
ගන්නේ ඔහුගේ අභ්‍යන්තරයෙන්
ය.එහෙයින් කෙනෙකුගේ බාහිර
ක්‍රියා වෙනස් වන්නේ නම්
ඔහුගේ අභ්‍යන්තරය වෙනස්
විය යුතු ය.වරද කළ ළමයෙකුට
දෙන දඬුවමෙන් හෝ දීර්ඝ
අනුශාසනාවෙන් හෝ සිදු නොවන
වෙනස සමහර විට ගුරුවරයාගේ
දයාන්විත බැල්මෙන් සිදුවන බැව්
ගුරුවරු දනිති. එසේ වන්නේ
දඬුවමට හෝ අනුශාසනාවට
විනිවිද ගිය නොහැකි තැනකට
ගුරුවරයාගේ අවංක දයාන්විත
බැල්ම ගමන් කරන බැවින් ය.එම
දයාන්විත බැලීම නිසා ළමයා තුළ
ඒ මොහොතේ දී ඇති වන්නේ
නියම ආගමික අධ්‍යාපනයකි. මං
පහරන මිනී මරන සොරුන්ගේ
චණ්ඩ හදය බුදුන්ගේ මෛත්‍රී
සහගත බැලීම් මාත්‍රයෙන්
මොලොක් වී උණු වී ගිය බව
කියති. ඒ සොරෙකු තුළ එවැනි
මොහොතක දී ඇති වූයේ ද නියම
ආගමික අධ්‍යාපනය යයි කිව යුතු
ය (අදිකාරම් 1978:55,56).

බුදුන් වහන්සේ අංගුලිමාල දමනය කිරීම පිණිස ජේතවනාරාමයෙන් වැඩමවන අවස්ථාවේ සිට කතා ප්‍රවෘත්තිය සඳහා ගුරුගෝමින් අංගුලිමාල සූත්‍රයෙන්

ආහාසය ලබා ගන්නා අන්දම දැන් විමසමු.

*මේ මහා අංගුල්මල් නම් සොරෙක. දරුණු ලේ මුසු අත් ඇත්තේය. සතුන් කෙරෙහි කුළුණු නැත්තේය, ගම් නොගම් කෙළේය. නියංගම් නොනියං ගම් කළේය. දනවු නොදනවු කළේය. මිනිසුන් මර මරා ඇඟිලි විද මාලා කොට දරයි. මහණ තෙලෙ මගට පුරුෂයෝ දස දෙනෙකුදු විසි තිස් සතළිස් පණස් දනකුදු සැක ඇති ව සන්නදව වහ වහව යෙති. ඔහුදු අඟුල්මල් සොරහු අත නසිති (අමාවතුර 1887: 26) යනුවෙනි.*

මේ අවස්ථාව අංගුලිමාල සූත්‍රයෙහි එන්නේ මෙසේය.

*මා සමණ, එතං මග්ගං පටිපජ්ජි, එතස්මිං සමණ, මග්ගෙ චොරො අංගුලිමාලො නාම ලුද්දො ලොහිතපාණි හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු. තෙන ගමාපි අගමා කතා, නිගමාපි අනිගමා කතා, ජනපදාපි අජනපදා කතා. සො මනුස්සෙ වධිත්වා වධිත්වා අංගුලීනං මාලං ධාරෙති. එතං හි සමණ, මග්ගං දසපි පුරිසා වීසතිම්පි පුරිසා තිංසම්පි පුරිසා චත්තාරිසම්පි පුරිසා පඤ්ඤාසම්පි පුරිසා සංහරිත්වා සංහරිත්වා පටිපජ්ජන්ති. තෙපි චොරස්ස අංගුලිමාලස්ස හත්ථත්ථඞ්ග ච්ඡන්තී'ති (මජ්ඣිම නිකාය, ද්විතීයභාගය: 516).*

ගුරුළුගෝමී වූ කලී ඉතිහාසයෙන් උපරිම ප්‍රයෝජන ගත් සිය අරමුණු සාක්ෂාත් කර ගනු සඳහා සියලු ශිල්ප ධර්ම නොපිරිහෙළා ප්‍රයෝජනයට ගත් අසහාය ගත් කතුවරයෙකි. ලේඛකයාගේ කාර්යභාරය මැනවින් වටහා ගෙන තම සමයෙහි ගෞරවය රකිනු සඳහා සමාජීය මෙහෙවරෙහි යෙදුණු එතුමා සමාජශෝධකයෙකි.

සමාජීය සාහිත්‍යය අධ්‍යයනයෙහි ලා වැදගත් වන කරුණු රැසක් පෙන්වා දෙන ඒ.වී.සුරවීර බටහිර විචාරකයකුගේ අදහස් උපුටා දක්වමින් පවසන්නේ එහි ලා කරුණු තුනක් වැදගත් වන බව යි. ජීවිතය පරිපූර්ණත්වයෙන් නිරූපණය කිරීමේ අවස්ථාව, යථාර්ථ නිරූපණය සඳහා සමාජ සාධාරණ හෙවත් සමාජය නියෝජනය කෙරෙන චරිත නිර්මාණය කිරීමේ අවශ්‍යතාව, එසේ ම ඉතිහාස ප්‍රවාහය ග්‍රහණය කිරීමේ අවශ්‍යතාව යනුයි. ඉතා සරල ලෙස පවසතොත් මින් අදහස් වන්නේ ලේඛකයා ස්වකීය සමාජය පිළිබඳ පූර්ණාවබෝධයකින් යුක්ත ව ඒ සමාජයේ ජීවත් වුව මනා බව ය. එවැනි ලේඛකයකුට ය, ඉතිහාස ප්‍රවාහය ග්‍රහණය කළ හැක්කේ. තමන් ජීවත් වන සමාජය පිළිබඳ පුළුල් අවබෝධයකින් යුක්ත ලේඛකයකුට ය, ඉතිහාසය ප්‍රවාහය පරිපූර්ණ ලෙස ප්‍රත්‍යක්ෂ කර ගත හැක්කේ (සුරවීර 1982: 27)

ගුරුළුගෝමීන් සම්පූර්ණයෙන් ම අමාවතුර කෘතිය වෙන්කරනුයේ බුදුන් වහන්සේ විසින් විෂම වූ චරිත ලෝ වැඩ පිණිස සකස් කරන ලද ආකාරය කතාරසය මුසුකොට පෙන්වා දෙනු පිණිස ය. ඒ අනුව සිද්ධාර්ථ ගෞතමයන් විසින් අංගුලිමාල සමාජ සත්ත්වයෙකු බවට පත් කරන ලද්දේ කෙලෙස ද යන්න විමසමු.

ප්‍රථමයෙන් සිද්ධාර්ථ ගෞතමයන් පිළිබඳ අවස්ථාව කොසොල් රජතුමා ලවා පාඨකයා වෙතට රැගෙන එන්නේ මෙසේ ය. කොසොල් රජුට, ජන ඝෝෂය හේතුවෙන් අඟුල්මල් ඇල්ලීමට යාමට සිදු වෙයි. ඔහු අතරමඟ දෙව්රම් වෙහෙරට යනුයේ අරමුණු දෙකක් පෙරදැරි කරගෙන ය. එකක් නම් බුදුන් වහන්සේ තමන් පරලොව වශයෙන් සසරින් ගලවන බව දැන ගෙන ය. අනික නම් මෙලොව වශයෙන් අංගුලිමාලගෙන් තමන් කෙසේ හෝ ගලවා ගන්නේ ය යන සිතිවිල්ලෙන් ය. රජුගේ යටිසිත හඳුනා ගන්නා බුදුන් වහන්සේ මෙසේ වදාරති.

*කිම මහරජ තට බිම්සර මහරජ කුපිත විය හෝ විසාලා මහනුවර වැසි ලිච්ඡවි රජහු කුපිත විය හෝ සෙසු ප්‍රතිපක්ෂ රජ කෙනෙක් කුපිත විය හොයි වදාළහ. වහන්සේ මට දැහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති. මගේ රට අඟුල්මල් නම් සොරෙක් විය. උහු ගන්නට යෙමි යි කීය (අමාවතුර 1887: 30,31).*

දමනය කර ගත් අංගුලිමාල තමා සමීපයේ හිඳුවාගෙන බුදුන් වහන්සේ සන්සුන් ව කොසොල්

රජතුමාගෙන් කරුණු අසන සොඳුරු විලාසය විමර්ශනය කරන්න.

ඉදින් මහරජ, තෝ අංගුලිමාලයා
කෙහෙ බා සිවුරු හැඳ පෙරෙවැ
පැවිජිව පණිවා ඇපව කමින්
විරතව එක් වේලේ වළඳා
බඹසරවස් ඇක සිල්වත් ව
කළණදහම් පුරා වසන්නාහු
දිටහි නම් උහුට කුමක් කෙරෙයි
වදාළහ. වහන්සේ අප ඔවුන්
දුටුමහ. දුටු කල හුනස්නෙන්
නැගෙම්හ. හිඳිනා අසුන් දෙම්හ.
සතර පසයෙන් උපස්ථාන කරම්හ
යි කීහ. කියා තබා බුදුහු ඔහුගේ
උපනිශ්‍රය බලා උහු ඇර පැවිජි
කළාහු වුහු නම් යහයයි සිතා
බුදුන් පිරික්සනු සඳහා වහන්සේ
ඒ දුසිල් පවිටු හට මෙබඳු සීල
සංගමයෙක් කොහි වේදැ යි කීය.
එසමාහි අඟුල්මල් තෙරහු බුදුනට
නුදුරු තන්හි වැඩ හුන්නාහු.
බුදුහු දකුණත නගා මහරජ මේ
අඟුල්මලැයි වදාළහ (අමාවතුර
1887: 30,31).

මේ අවස්ථාව චිත්‍රපටයක් මෙන් පාඨකයා රසවත් කිරීමට අංගුලිමාල සූත්‍රයෙන් ද අමාවතුරෙන් ද ඉඩ සැලසෙයි. කොසොල් රජ මහත් වූ තැති ගැන්මෙන් අසරණ වන අයුරුත් සිය පිරිවර කඩු පළඟ දමා සිස් ලූ ලූ අත දුවන සැටිත් මේ සාහිත්‍යකරුවන් කෙතරම් සිත් අලවන ආකාරයෙන් විස්තර කොට ඇත් ද? බුදුන් වහන්සේ පිළිබඳ ව පාඨකයා කෙරෙහි ඇතිවන්නේ කවර නම් බැති පෙමක් ද?

බුදුහු රජහට භය උපන් බැව් දැන නො බව මහරජ මේ දැන් කුහුඹුවකුදු දිවි නොගලවයි මුහු කෙරෙන් තට භය නැතැයි වදාළෝ (අමාවතුර 1887: 30,31). අනතුරුව රජ අංගුලිමාල තෙරුන් සමීපයට ගොස් වැඳ කරුණු පිළිවිසින ආකාරයත් සතර පසයෙන් උපස්ථාන කිරීමට පිළින දී සිය බඩ බද සළුව ගෙන අඟුල්මල් තෙරුන් පුදන ආකාරයත් පිළිබඳ පාඨකයා කෙරෙහි මැවෙන චිත්ත රූපය කෙතරම් ප්‍රසන්න ද?
කොසොල් රජතුමා අනතුරු ව බුදුන් වහන්සේ සමීපයට පිවිසෙයි.

වැඳ එකත්පස් ව හිඳ වහන්සේ
ආශ්චර්ය අත්භූතය, වහන්සේ
අදාන්ත සතුන් දමනදෑය,
නොපිරිනිවි සතුන් කෙලෙස්
පිරිනිවන්නින් නිවනදෑය, වහන්සේ
අප් දඬුවුරු සැතිවුරු සතුන්
දමන්නට නොහැක්කමහ. වහන්සේ
නොදඩින්ම නොසැතින්ම සතුන්
දමනදෑය (අමාවතුර 1887: 30,31,
මජ්ඣිම නිකාය, ද්විතීයභාගය:
522-525)

පාඨකයා තුළ බුදුන් වහන්සේ නමැති මේ ශ්‍රේෂ්ඨ මිනිසා පිළිබඳ ව ඇති කරවන හැඟීම දෙගුණ තෙගුණ වන්නේ අංගුලිමාල සමාජයට අනුගත මනුෂ්‍යයෙකු බවට පත් කරන ආකාරයෙනි.

අංගුලිමාල තෙරුණුවෝ පිඬු සිගන්නට ගිය කල කැඳ හෝ බත් කෙණෙස්සක් හෝ නොලබති. අහර නොමැති ව ක්ලාන්ත වෙති. එක් නුවරකින් ගිය කල සිදුවන්නේ ද මේ දේ ම ය. එහෙත් සැවැත් නුවර පිඬු සිගා යද්දී සිදුවන එක් සිදුවීමෙකින් අංගුලිමාල තෙරුන්ගේ හදවත බෙහෙවින් කම්පනයට පත් වෙයි. එය බුදුන්වහන්සේ හමුවෙහි ප්‍රකාශ කරන ආකාරය අංගුලිමාල තෙරුන් බුදුන් වහන්සේ හා තර්ක කරමින් එය තමන්ට නොගැළපෙන ආකාරය විමසන අයුරු බලන්න.

වහන්සේ සැවැත් නුවර කෙණෙයි
අහරසිඟනෙම් එක් මූඪගර්භ
මාගමක් දිටිමි, ඇය විඳිනාදුක් මට
නොරිසිය යී කිහු. එසේ බැවින්
තෝ ඈ කරා ගොස් මා උපන්
තැන පටන් ගෙණ දැන දැන
සතක්හු දිවි නොගැලවීම් නම් ඒ
සයින් තිටදු ගබටදු සෙත් වේවා
යි සස්කරා යී වදාළෝ. වහන්සේ
ඒ මට මුසාව වෙයි. මා විසින්
බොහෝ සතුන් දැන දැන මරණ
ලදහ යි කීහු. අංගුලිමාලය හේ තා
ගිහිමිනිස් කල. ගිහිමිනිස්සුනම්
සතුන් මරණු ආදි කෙරෙත්, දැන්
තට ආර්ය නම් ජාතියෙක් ඇති.
එසේ බැවින් තෝ මා උපන් තැන්
පටන්ගෙණය යී කියන තැන
කුකුස් ඇති වී නම් ආර්යජාති
උපන්තැන් පටන්ගෙණ යී කියා
යී නගා යවුහු (අමාවතුර 1887: 32,
මජ්ඣිම නිකාය, ද්විතීයභාගය:
522-525).

බුදුන් වහන්සේගේ උපදෙසින් ක්‍රියාත්මක වන අංගුලිමාල තෙරුන් වහන්සේ ප්‍රසව වේදනාවෙන් පෙළෙන ගැබිණිය වෙත ගොස් සෙත් කොට ඇ එයින් මුදවන්නේ මෙසේ ය.

"මා ආර්යජාතින් උපන් තැන් පටන් ගෙණ දැන දැන සතක්හු දිවි නොගැලවිම් නම් ඒ සසින් තිටදු ගබටදු සෙත් වේවා යි"(අමාවතුර 1887: 32, මජ්ඣිම නිකාය, ද්විතියභාගය: 524-525) යනුවෙනි.

බුදුන් වහන්සේ මෙය සිතා මතා ම කළ කටයුත්තක් සේ අමාවතුරකරුවා මේ අවස්ථාව විස්තර කරන්නේ මෙසේ ය.

> මහතෙරුන් දැක මිනිස්සු බා
> පලති. ඔවුන් කෙණසි අහර
> නොලදින් ක්ලාන්තව මහණුවම්
> කරන්නට නොනිස්සහ. මෙසේ
> වන්නා හා දැන් අඟුල්මල්තෙරහු
> මෙත්සිත් පිළලදින් සස්කොට
> මිනිස්නට සෙත් කෙරෙත්යි
> මිනිස්සු මහතෙරුන් කෙරෙහි
> නොබා එළඹයටි වෙත් එකල
> අහරින් ක්ලාන්ත නොව මහණුවම්
> කරන්නට නිසාවෙත්. එයින්
> බුදුහු ඔවුන් කෙරේ අනුග්‍රහයෙන්
> සත්‍යාක්‍රියා කරවුහු (අමාවතුර 1887:
> 32).

මිනිසුන් දහසට ආසන්න පිරිසක් ඝාතනය කොට කිසිදු දඬුමකට යටත් නොවී සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ විසින් සමාජ වැඩ සඳහා අඟුල්මල් තෙරුණුවන් සකස් කරන ආකාරය කෙතරම් ද? නව ජීවිතයකට එළඹෙන ප්‍රාණියෙකුට සිය මව් ගැබෙන් නික්මෙන අවස්ථාවේ සුවසේ නික්මෙන්නට ආශිර්වාද කිරීමට සැලසෙන ආකාරය අනුපමේය ලෙස මවා පෑමට ගුරුළුගෝමීහු සමත් වෙති.

මෙකී සිදුවීමේ ඇති සංස්කෘතික වටිනාකමකින් යුතු කරුණ නම් අමාවතුරකරුවා මේ සම්බන්ධයෙන් පවසන "මෙ කැප සිටිනා පෙළහරයි"යනාදි වශයෙන් දක්වන අදහස යි. අවුරුදු දෙදහස් පන්සීයකට එහා සිදුවන බුදුන් වහන්සේගේ ජීවන ප්‍රවෘත්තිය සාහිත්‍යයෙන් සමාජයටත් එයින් සංස්කෘතියටත් කෙතරම් සමාජානුයෝජනය වී ඇත්දැ යි විමසන විට විස්මය දනවන සුළු ය. විසි එක් වන සියවසට එළඹ සිටින නූතන බෞද්ධ කාන්තාව පමණක් නො ව බටහිර රටවල ඇතැම් කාන්තාවෝ ද දේශ කාල භේදයකින් තොර ව සිය දාරක ප්‍රසූති අවස්ථාවල දී අංගුලිමාල පිරිතෙහි ඵල ලබා ගනිති. මේ පිරිත සවන් පත් සෑම අවස්ථාවක දී ම මේ කතා ප්‍රවෘත්තියෙහි දිස්වන ගුරු ගෝල සබඳතාවෙන් හදවත කම්පනයට පත් වන වා සේ ම එවකට අප විසින් උගන්වන ලද ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වෙතින් අපි මේ පිරිත අසා ලබා ලත් සෙත් ශාන්ති සිහිකර පහන් සංවේගය මුසු හැඟීමෙන් අංගුලිමාල පිරිත මෙසේ සටහන් කොට තබමු.

"පරිත්තං තා භණන්තස්ස, නිසින්නට්ඨානොධොවනං,
උදකම්පි විනාසෙති, සබ්බමෙව පරිස්සයං,
සොත්ථිනාගබ්බවුට්ඨානං, යං ච සාධෙති තං ඛණෙ,
ථෙරස්සංගුලිමාලස්ස, ලොකනාථෙන භාසිතං
කප්පට්ඨායිමහාතෙජං පරිත්තං තං භණාමහෙ.

යතො' හං හගිණි අරියාය ජාතියා ජතො නාභාජානාමි සංවිච්ච පාණං ජීවාතා වොරොපෙතා, තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සාති (මහ පිරිත්පොත 1995: 322)

"යම් පිරිතක් දේශනා කරන්නහුගේ ආසනය සෝදන ජලය පවා සියලු උවදුරු දුරු කරයි ද සුවසේ ගැබ බිහි කිරීමට එකිණෙහි යම් පිරිතක් පිහිට වී ද අඟුල්මල් තෙරුන්හට ලෝනා විසින් දේශනා කරන ලද කපක් පවත්නා මහ තෙදැති ඒ පිරිත අපි කියමු."

"නැගෙණියනි, ආර්ය ජාතියෙහි උපන් මම දැන දැන සතකු ජීවිතයෙන් තොර කළ බවත් නොදනිමි. ඒ සත්‍යයෙන් ඔබටත් ගැබටත් යහපතක් (සුවයක්) වේවා"

### ආශ්‍රේය ග්‍රන්ථ


අංගුලිමාල සුත්තං (1973) සූත්‍රාන්ත පිටකය, මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

අදිකාරම් ඊ ඩබ්ලිව් (1978) සිතුවිලි කාණ්ඩ IV,නිකම් ඉදීම සහ වෙනත් ලිපි, සිතුවිලි සමාජය, නුගේගොඩ,

අමාවතුර (1887) සංස්. හෙන්ද්‍රික් ජයතිලක අප්පුහාමි, II මුද්‍රණය, ජොස් ෆොන්සේකා ඇන්ඩ් සන්ස් ප්‍රින්ටර්ස්, කොළඹ

පල්ලියගුරු චන්ද්‍රසිරි (2002) සාහිත්‍යය සමාජ විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ,

පිරුවාණා පොත් වහන්සේ නම් යුත් මහා පිරිත්පොත (1995) ගුණසේන සහ සමාගම කොළඹ.

සුරවීර ඒ.වී (1982) සමාජීය හා සාහිත්‍යය අධ්‍යයනය, ලේක්හවුස්, කොළඹ